සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved


# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# කෘෂි විද්‍යාව - I

**12 ශ්‍රේණිය**

**කාලය පැය 02 යි.**

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.**

---

01 ශාකයකට සැලකිය යුතු තරමින් නයිට්‍රජන්, පොටෑසියම්, පොස්පරස් වැනි මූලද්‍රව්‍ය අවශ්‍ය වන අතර ඒවා හඳුන්වනු ලබන්නේ,

(1) එන්සයිම සක්‍රියකාරක ලෙසය.
(2) ක්ෂුද්‍ර පෝෂක ලෙසය.
(3) මහා පෝෂක ලෙසය.
(4) සහඑන්සයිම ලෙසය.
(5) පොහොර ලෙසය.

02 ආග්නේය පාෂාණ යනු

(1) පෘථිවි පෘෂ්ඨය සිසිල්වීමෙන් සෑදුන දෙයකි.
(2) ප්‍රාථමික පාෂාණ ජීර්ණය, ප්‍රවාහණය හා නැවත තැන්පත්වීමේ ප්‍රතිඵලයකි.
(3) බර මැටි තැන්පතු අධික පීඩනයකට භාජනය වී සෑදුන දෙයකි.
(4) හුණුගල් අධික උෂ්ණත්වයකට භාජනයවීමෙන් සෑදුන දෙයකි.
(5) අධික පීඩනය හා උෂ්ණත්වයට භාජනය වූ අවසාදිත පාෂාණ වලින් සෑදුන දෙයකි.

03 ශාක සෛල තුළ ස්වසනය සිදුවන්නේ,

(1) වර්ණ දේහවල ය.
(2) න්‍යෂ්ඨියේ ය.
(3) රයිබෝසෝමවල ය.
(4) හරිතලවවල ය.
(5) මයිටොකොන්ඩ්‍රියාවල ය.

04 ශාකවල ද්වි ගෘහිතාව අනුවර්තනයක් වනුයේ,

(1) කෘමි පරාගණය සඳහා ය.
(2) අලිංගික ප්‍රචාරණය සඳහා ය.
(3) ස්ව පරාගනය සඳහා ය.
(4) පර පරාගණය සඳහා ය.
(5) සහභිජනනය සඳහා ය.

05 සෛල විභාජනය, සෛල දික්වීම හා අග්‍රස්ථ ප්‍රමුඛතාව උත්තේජනය වනුයේ,

(1) සයිටොකයිනීන් මගිනි.
(2) එතිලීන් මගිනි.
(3) ඇබ්සිසික් අම්ලය මගිනි.
(4) ඔක්සීන මගිනි.
(5) ගිබරලීන මගිනි.


06 ජෛව විද්‍යාත්මක පළිබෝධ පාලන වැඩසටහන්වල දී විලෝපිකයන් බහුලව යොදාගැනේ. එවැනි විලෝපිකයකුට උදාහරණයක් වනුයේ,

(1) ගොම කුරුමිණියා ය.
(2) ලේඩි බර්ඩ් කුරුමිණියා ය.
(3) පැළ කීඩෑවාය.
(4) පතංගයා ය.
(5) පලතුරු මැස්සා ය.

07 ජිහ්වලයක් සහිත දිගටි සිහින් පත්‍ර ඇති ඒක බීජ පත්‍රි වල් පැළෑටියක් වනුයේ,

(1) බහු වාර්ෂික ශාකයකි.
(2) තෘණ ශාකයකි.
(3) පළල් පත්‍ර ශාකයකි.
(4) වාර්ෂික ශාකයකි.
(5) පන් ශාකයකි.

08 රූපයේ දැක්වෙන මෙම පාංශු ව්‍යුහය වඩාත් හොඳින් විස්තර කළ හැක්කේ,



(1) ප්‍රිස්මාකාර ලෙසය.
(2) තනි කණිකා ලෙසය
(3) කැටිති ලෙසය.
(4) කුට්ටි ලෙසය.
(5) කණිකාමය ලෙසය.

09 පසේ ඇති පළිබෝධ නාශක අවසානයේ දී බිඳ දමනු ලබන්නේ,
(1) ගැඩවිල් පණුවන් මගිනි. (2) පාංශු කලිල මගිනි.
(3) භූගත ජලය මගිනි. (4) බැක්ටීරියා හා දිලීර මගිනි.
(5) කාබනික ද්‍රව්‍ය මගිනි.

10 ක්වීනින් ලබාගනුයේ,
(1) මිංචි වලිනි. (2) දුම්කොළ මගිනි.
(3) සින්කෝනා වලිනි. (4) කොහොඹ වලිනි.
(5) කෝමාරිකා වලිනි.

11 ශිෂ්‍යයෙක් එක්තරා ශාකයක පුෂ්ප ජීව විද්‍යාව පරීක්ෂාවෙන් අනතුරුව පහත නිරීක්ෂණ සිදු කළේය.
- කුඩා සුදු ද්විලිංගික පුෂ්ප ඇත.
- කිසිදු ගන්ධයක් හෝ මල් පැණි නොමැත.
- පරාග බර අතර, කලංකය කුඩාය.

මෙම ශාකය වඩාත් හොඳින් විස්තර කළ හැක්කේ,
(1) කෘමීන් මගින් පරාගණය වන ශාකයක් ලෙසය.
(2) විසංයෝගික ශාකයක් ලෙසය.
(3) පර පරාගණය වන ශාකයක් ලෙසය.
(4) සුළං මගින් පරාගණය වන ශාකයක් ලෙසය.
(5) ස්ව පරාගණය වන ශාකයක් ලෙසය.

The National e-Learning Portal for The General Education

12 පලතුරු හා එළවළු පරිරක්ෂණයේ දී සුබ්‍රීකරණය සිදුකරනුයේ
(1) ද්‍රව්‍ය මෘදු කිරීමට ය. (2) එන්සයිම අක්‍රිය කිරීමට ය.
(3) ක්ෂුද්‍ර ජීවීන් අක්‍රිය කිරීමට ය. (4) භෞතික හානි අවම කිරීමට ය.
(5) රසායනික ක්‍රියා උත්තේජනය කිරීමට ය.

13 ශාකයෙන් ශාකයට රෝග කාරකයන් රැගෙන යන්නේ,
(1) පළිබෝධය (2) පිලෝපිකයින්ය
(3) වාහකයින්ය (4) ව්‍යාධිජනකයින්ය
(5) පරපෝෂිතයින්ය

14 පොතු වළලු ගැසීම සිදුකෙරෙන ශාක ප්‍රචාරණ ක්‍රමය වනුයේ,
(1) අතු කැබලි සිටුවීමයි. (2) අතු බැඳීමයි.
(3) අංකුර බද්ධයයි. (4) ක්ෂුද්‍ර ප්‍රචාරණයයි.
(5) රිකිලි බද්ධයයි.

15 ජෛව සංචායකයට වඩාත් ග්‍රාහිය ශාක වනුයේ,
(1) සඵලතාව වැඩි ශාක වේ. (2) ස්ඵලතාව අඩු ශාක වේ.
(3) ඉහළ ප්‍රජනක ධාරිතාවක් සහිත ශාක වේ. (4) කෙටි ආයුෂ සහිත ශාක වේ.
(5) දීර්ඝ ආයුෂ සහිත ශාක වේ.

16 බීජ ගබඩා කිරීමේ දී වඩාත් සුදුසු තත්ත්වය වනුයේ,

(1) අඩු උෂ්ණත්වය හා ආර්ද්‍රතාවයයි. (2) අඩු ආලෝක තීව්‍රතාව හා උෂ්ණත්වයයි.

(3) අඩු උෂ්ණත්වය හා ආර්ද්‍රතාවයයි. (4) අඩු ආලෝක තීව්‍රතාවය හා ආර්ද්‍රතාවයයි.

(5) අඩු වාතනය හා උෂ්ණත්වයයි.

17 වර්තමානයේ ශ්‍රී ලංකාවේ වඩාත් බහුලව භාවිතා වන ප්‍රචාරක ව්‍යුහය වනුයේ,

(1) පොලිතීන් ගෘහ (2) හරිතාගාර

(3) පොල්අතු නිවාස (4) ලැන් නිවාස

(5) උඩවැඩියා නිවාස

18 අනුපූරක සාධක ප්‍රවේණි පරම්පරාවෙහි රූපාණුදර්ශ අනුපාතය වනුයේ,

(1) 13 : 3 (2) 9 : 6 : 1 (3) 12 : 3 : 1 (4) 9 : 7 (5) 15 : 1

19 පාංශු වයනයට අඩුම බලපෑමක් ඇත්තේ,

(1) පසේ අඩංගු ජලය ප්‍රමාණයෙන් ය. (2) පසේ අඩංගු රොන්මඩ ප්‍රමාණයෙන් ය.

(3) පසේ අඩංගු මැටි ප්‍රමාණයෙන් ය. (4) බොරළු ප්‍රමාණයෙන් ය.

(5) පස් අංශුවල ප්‍රමාණාත්මක ව්‍යාප්තියෙන් ය.

20 ප්‍රභාසංස්ලේෂණය සිදුවන්නේ,

(1) සනාල කදම්බ තුළය. (2) පූටිකා තුළය.

(3) උච්චර්මය තුළය. (4) මජ්ජා පටක තුළය.

(5) උඩ අපිචර්මය තුළය.

21 වල් නාශකයක පොදු ලක්ෂණයක් වනුයේ එය පසට යෙදූ පසු මාස 2 ක් හෝ වැඩි කාලයක් සක්‍රියව පැවතීමය. මෙම වල් නාශකය වඩාත් හොඳින් විස්තර කළ හැක්කේ,

(1) වරණීය වල්නාශකයක් ලෙසය. (2) ස්පර්ශ වල්නාශකයක් ලෙසය.

(3) පූර්ව නිර්ගමන වල්නාශකයක් ලෙසය. (4) සංස්ථානික වල්නාශකයක් ලෙසය.

(5) පශ්චාත් නිර්ගමන වල්නාශකයක් ලෙසය.

22 ශක්තිය අඩංගු පෝෂක කාණ්ඩය වනුයේ,

(1) පිෂ්ඨය, කැල්සියම් සහ විටමින් C ය.


(2) කාබෝහයිඩ්රේට්, ලිපිඩ සහ විටමින් ය.

(3) අත්‍යවශ්‍ය ඇමිනෝ අම්ල, අත්‍යවශ්‍ය මේද අම්ල සහ අත්‍යවශ්‍ය ඛණිජ වේ.

(4) ග්ලූකෝස්, විටමින් B සහ විටමින් E ය.

(5) සෙලියුලෝස්, මෙතයොනින් සහ ස්ටියරික් අම්ලයය.

23 මෙම රූපයේ දක්වා ඇති තත්ත්වය වඩාත් හොඳින් විස්තර කරන්නේ පහත සඳහන් කුමන වගන්තියේ ද?




(1) A සහ B යන දෙකම ශාක ප්‍රරෝහ වේ.

(2) A යනු ශාක ප්‍රරෝහයකි. B යනු ශාක මූලකි.

(3) A සහ B යන දෙකම ශාක කොටස් නොවේ.

(4) A යනු ශාක මූලකි. B යනු ශාක ප්‍රරෝහයකි.

(5) A සහ B යන දෙකම ශාකයක මුල්ය.

24 ආහාරවලට ප්‍රති ඔක්සිකාරක එකතු කරනු ලබන්නේ,

(1) ජලය සහ විටමින් නැතිවීම වළක්වා ගැනීමට ය.

(2) විටමින් සහ එන්සයිම නැතිවීම වළක්වා ගැනීමට ය.

(3) මුඩුවීම සහ දූර්වර්ණ වීම වළක්වා ගැනීමට ය.

(4) දූර්වර්ණ වීම සහ එන්සයිම ක්‍රියාකාරීත්වය වළක්වා ගැනීමටය.

(5) මුඩුවීම සහ එන්සයිම ක්‍රියාකාරීත්වය නැතිවීම වළක්වා ගැනීමට ය.

25 පාසල් කාලගුණික මධ්‍යස්ථානයකදී ආලෝකයේ කාලසීමාව මනිනු ලබන්නේ,

(1) සූර්ය දීප්තිමානයෙනි (2) සූර්ය විකිරණ මානයෙනි

(3) උපරිම උෂ්ණත්වමානයෙනි (4) අවම උෂ්ණත්ව මානයෙනි

(5) තෙත් හා වියලි බල්බ උෂ්ණත්ව මානයෙනි

26 පලතුරු හා එළවළු ශ්‍රේණිගත කිරීමෙන් ඒවායේ

(1) විකුණුම් මිල වැඩිකර ගත හැකිවේ. (2) පසු අස්වනු හානි වැඩිවේ.

(3) මිල ස්ථාවර කිරීමට හැකිවේ. (4) මිල පාලනය කිරීමට හැකිවේ.

(5) වෙළඳපොළ ඉල්ලුම අඩු කළ හැකිවේ.

27 හපාකන මුඛ කොටස් සහිත කෘමීන්ගෙන් ශාකයකට සිදුවන ප්‍රධාන හානිය වනුයේ,

(1) සෛල යුෂ උරාබීමය. (2) ප්ලෝයම් පටක අවහිර කිරීමය.

(3) වෛරස් රෝග සම්ප්‍රේෂණය වීමය. (4) ප්‍රභාසංස්ලේෂක පටක ඉවත් කිරීමය.

(5) බැක්ටීරියා රෝග සම්ප්‍රේෂණය වීමය.

28 පුරුෂ ලිංගික හෝර්මෝනයක් සඳහා උදාහරණයක් වන්නේ,

(1) ඩයි ඊතයිල් ස්ටිල්බෙස්ට්‍රෝල් (2) තයිරොක්සීන්

(3) ප්‍රොජෙස්ටෙරොන් (4) ටෙස්ටෙස්ටෙරෝන්

(5) ඊස්ට්‍රජන්

29 වියලි කලාපීය පසෙහි රතු පැහැයට ප්‍රධාන හේතුව

(1) බොරළු තිබීමය (2) අධික මැටි ප්‍රමාණයක් තිබීමය

(3) පෙල්ස්පාර් අධික ඛණිජ තිබීමය (4) යකඩ ඔක්සයිඩ් තිබීමය

(5) සිලිකේට් මැටි ඛණිජ තිබීමය

30 තුත්තනාගම් යනු

(1) ජිප්සම්වල අඩංගු ද්‍රව්‍යයකි. (2) අත්‍යවශ්‍ය ක්ෂුද්‍ර මූලද්‍රව්‍යයකි.

(3) අත්‍යවශ්‍ය නොවන මූලද්‍රව්‍යයකි. (4) ශාකවලට විෂ ද්‍රව්‍යයකි.

(5) අත්‍යවශ්‍ය මහා මූලද්‍රව්‍යයකි.

31 බෝගයක ඉහළම බෝග සංගුණකය දක්නට ලැබෙනුයේ එම බෝගයේ,

(1) ක්‍රියාකාරී වර්ධක අවස්ථාවේ දී ය. (2) පැළ සහ පරිනත යන අවස්ථාවේ දී ය.

(3) පරිනත අවස්ථාවේ දී ය. (4) ප්‍රජනක අවස්ථාවේ දී ය.

(5) පැළ අවස්ථාවේ දී ය.

32 ආහාර කල්තබා ගැනීමට ශීත කිරීම උපකාරී වනුයේ

A ක්ෂුද්‍ර ජීවීන්ගේ වර්ධනය අඩු කිරීම මගිනි. B ක්ෂුද්‍ර ජීවීන් විනාශ කිරීම මගිනි.

C ජල ක්‍රියාකාරීත්වය අවම කිරීම මගිනි. D ලබාගතහැකි පෝෂක අවම කිරීම මගිනි.

මෙයින් නිවැරදි ප්‍රකාශ වනුයේ,

(1) B හා C පමණි. (2) A, B හා C පමණි.

(3) A සහා B පමණි. (4) A හා C පමණි.

(5) A, B, C හා D යන සියල්ලම

33 ද්විබීජ පත්‍රී බීජ පිළිබඳව වඩාත් නිවැරදි ප්‍රකාශය වනුයේ,

(1) වර්තිකාවෙහි ආහාර තැන්පත් වී ඇත. (2) මේරූ බීජවල භ්‍රෑණ පෝෂය දැකිය නොහැකිය.

(3) බීජ පත්‍ර දැකිය නොහැකිය. (4) ඵලාවරණය බීජ පත්‍රවලට තදින් බැඳී ඇත.

(5) බීජ ලපය හා අනුද්වාරය දැකිය නොහැකිය.

The National e-learning Portal for The General Education

34 ඉහළ පාරිභෝගික ජල භාවිතයක් සහිත බෝග වඩාත් සුදුසු වන්නේ,
(1) අඩු ධන වාෂ්පීකරණ උත්ස්වේදනයක් සහිත භූමිවලට ය.
(2) ශූන්‍ය වාෂ්පීකරණ උත්ස්වේදනයක් සහිත භූමිවලට ය.
(3) ඍජු වාෂ්පීකරණ උත්ස්වේදනයක් සහිත භූමිවලට ය.
(4) ඍණ වාෂ්පීකරණයක් සහිත භූමිවලට ය.
(5) ඉහළ ධන වාෂ්පීකරණ උත්ස්වේදනයක් සහිත භූමිවලට ය.

35 පෘථිවි කබොල්ලේ වඩාත්ම සුලභ මූලද්‍රව්‍යයන් වනුයේ,
(1) ඇළුමිනියම් හා යකඩය
(2) ඔක්සිජන් හා සිලිකන්ය
(3) ඔක්සිජන් හා ඇළුමිනියම්ය
(4) කාබන් හා ඔක්සිජන්ය
(5) කාබන් හා සිලිකන්ය

36 MS (Murashige and Skoog) මාධ්‍ය ලෙස සලකනු ලබන්නේ,
(1) කෘමිනාශකයක් ලෙසය.
(2) දිලීර නාශකයක් ලෙසය.
(3) පටක රෝපණ මාධ්‍යයක් ලෙසය.
(4) දියර පොහොරක් ලෙසය.
(5) ශාක වර්ධක යාමනයක් ලෙසය.

37 පසේ සවිවරතාව මූලිකව රඳාපවතින්නේ,
(1) වගා කළ බෝග වර්ගය හා ප්‍රභේදය මතය
(2) මාතෘ ද්‍රව්‍ය හා පස නිර්මාණය වීමේ ක්‍රියාවලිය මතය
(3) කාබනික ද්‍රව්‍යවල සංයුතිය හා පසේ ගැඹුර මතය
(4) දෘශ්‍ය ඝණත්වය හා පසේ ව්‍යුහය මතය
(5) විශිෂ්ඨ ගුරුත්වය හා පසේ තෙතමන ප්‍රමාණය මතය

38 වායුගෝලයේ ඇති කාබන්ඩයොක්සයිඩ්, ජල වාෂ්ප, මීතෙන් හා නයිට්‍රස් ඔක්සයිඩ් ප්‍රමාණය අධික වීම හේතුවෙන් පෘථිවිය මතුපිටට තාපය පරාවර්තනය වීම හැඳින්වෙනුයේ,
(1) කාන්තාරකරණය ලෙසය.
(2) සූර්ය අන්තරික්ෂණය ලෙසය.
(3) අම්ල වැස්ස ලෙසය.
(4) හරිතාගාර ආවරණය ලෙසය.
(5) ඕසෝන් ස්ථරය ක්ෂයවීම ලෙසය.

39 ජීවානුහරණය පැස්ටරීකරණයෙන් වෙනස් වනුයේ,
(1) එය ව්‍යාධිජනක ක්ෂුද්‍ර ජීවීන් තෝරා විනාශ කරන බැවිනි.
(2) එය සියලු ක්ෂුද්‍ර ජීවීන් විනාශ කරන බැවිනි.
(3) එයට වැඩි කාලයක් තුළ අඩු උෂ්ණත්වයක් අවශ්‍ය වන බැවිනි.
(4) එයට කෙටි කාලයක් තුළ අඩු උෂ්ණත්වයක් අවශ්‍ය වන බැවිනි.
(5) එය කුණුවීම සඳහා හේතුවන ක්ෂුද්‍ර ජීවීන් තෝරා විනාශ කරන බැවිනි.

40 ශ්‍රී ලංකාවට ආරක්ෂිත කුටීර තුළ බෝග වගාව ප්‍රධාන වශයෙන් හඳුන්වා දුන්නේ,
(1) කෘෂිකර්මාන්තයෙහි පළිබෝධනාශක භාවිතය අඩු කිරීම සඳහා ය.
(2) ඉහළ වටිනාකමක් සහිත බෝග අවාරයෙහි වගාකිරීම සඳහා ය.
(3) පළිබෝධ සහ රෝගවලින් ක්ෂේත්‍ර බෝග ආරක්ෂා කර ගැනීම සඳහා ය.
(4) කෘෂිකාර්මික නිෂ්පාදනයෙහි ගෝලීය ප්‍රවණතා සමග මුහුවීම සඳහා ය.
(5) කෘෂිකර්මය කෙරෙහි තරුණ පරපුර ආකර්ෂණය කර ගැනීම සඳහා ය.

41 වැලිමය පසක ජලය රඳවාගැනීමේ හැකියාව වැඩිවනුයේ,
(1) පස හෑමෙන් හා පෝරු ගෑමෙනි.
(2) රෝලක් භාවිතයෙන් පස තද කිරීමෙනි.
(3) පස මඩකර පසුව වියළීමට හැරීමෙනි.
(4) පසට මැටි එක්කිරීමෙනි.
(5) පස ක්ෂේත්‍ර ධාරිතාවෙන් 50% වන තෙක් වියළීමෙනි.

42 පෘෂ්ඨීය, උප පෘෂ්ඨීය, විසුරුම් සහ බිංදුමය ක්‍රම අතුරින් වැලිමය පසකට වඩාත්ම යෝග්‍ය ජල සම්පාදන ක්‍රම/ක්‍රමය වනුයේ,

(1) උප පෘෂ්ඨීය, විසුරුම් සහ බිංදුමය ජලසම්පාදන ක්‍රම වේ.
(2) බිංදුමය ජලසම්පාදන ක්‍රමය පමණක් වේ.
(3) විසුරුම් සහ බිංදුමය ජලසම්පාදන ක්‍රම වේ.
(4) විසුරුම් ජලසම්පාදන ක්‍රමය පමණක් වේ.
(5) ඉහත සඳහන් ඕනෑම ක්‍රමයක් වේ.

43 ගැඩවිලුන් විසින් පසෙහි කුහර සෑදීමෙන්

(1) පසෙහි ජලවහනය, වාතනය හා පාංශු ව්‍යුහය දුර්වල වේ.
(2) පසෙහි ජීවත් වන ක්ෂුද්‍ර ජීවීන්ගේ ප්‍රභාසංස්ලේෂණයට උපකාරී වේ.
(3) ශාකවලට යාන්ත්‍රික ආධාරකයක් සහ පෝෂක සැපයේ.
(4) පසෙහි දෘෂ්‍ය ඝණත්වය අඩුවේ.
(5) පසෙහි ඇති ශාක පෝෂක දියවේ.

44 සරල ප්‍රචාරක ව්‍යුහ භාවිතයේ ප්‍රධානතම වැදගත්කම වනුයේ,

(1) ආර්ද්‍රතාවය හා උෂ්ණත්වය පාලනය කිරීමෙන් ඉක්මනින් අතු කැබලිවල මුල් අද්දවා ගැනීමය.
(2) පැළ දෘඩිකර ගැනීමය.
(3) පැළවල ජීවිත කාලය වැඩිකර ගැනීමය.
(4) ආර්ද්‍රතාවය හා සූර්යාලෝකය පාලනය කිරීම මගින් රෝගවලට ඔරොත්තු දීමයි.
(5) උෂ්ණත්වය පාලනය මගින් පැළ මේරීමට ලක්කිරීමයි.

45 වෛරස වලින් තොර ශාක නිපදවීමට හොඳම ක්‍රමය වනුයේ,

(1) කළල රෝපණය
(2) බීජ රෝපණය
(3) විභාජක පටක රෝපණය
(4) පරාගධානී රෝපණය
(5) පරාග රෝපණය

46 අකුණු ගැසීමේ දී වායුගෝලීය නයිට්‍රජන් ප්‍රතික්‍රියා කරන ආකාරය වඩාත් හොඳින් විස්තර කෙරෙන සමීකරණය වනුයේ,

(1) $NO + O_2 \rightarrow N_2O_4$
(2) $N_2 + 2O_2 \rightarrow N_2O_4$
(3) $NH_2 + CO_2 \rightarrow NH_2$
(4) $N_2 + O_2 + H_2 \rightarrow HNO_3 + NO$
(5) $NO + O_2 \rightarrow N_2O_4$

47 පැළෑටි සංරක්ෂණයට විවිධ පියවරයන් ගෙන ඇත්තේ,

(1) 1958 අංක 1 දරණ පනතෙනි.
(2) 1974 අංක 2 දරණ පනතෙනි.
(3) 1989 අංක 23 දරණ පනතෙනි.
(4) 1999 අංක 85 දරණ පනතෙනි.
(5) 2000 අංක 46 දරණ පනතෙනි.

48 පසක කැටායන හුවමාරු ධාරිතාව ප්‍රකාශ කරනුයේ,

(1) පස් ග්‍රෑම් 100 කට මිලි සමක ලෙසය.
(2) පස් කිලෝග්‍රෑම් 1 කට මිලි සමක ලෙසය.
(3) පස් ග්‍රෑම් 100 කට මිලි ග්‍රෑම් ලෙසය.
(4) පස් කිලෝග්‍රෑම් 1 කට මිලි ග්‍රෑම් ලෙසය.
(5) පස් මිලි ග්‍රෑම් 10 කට ග්‍රෑම් ලෙසය.

49 ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ වඩාත් සුළභ පස් කාණ්ඩය වන්නේ,

(1) රතු කහ පොඩ්සොලික් පසය
(2) දියළු පසය
(3) රතු කහ ලැටසෝල් පසය
(4) ලැටරිටික් පසය
(5) රතු දුඹුරු පසය

50 හරිතාගාර ආචරණයට වැඩිම බලපෑමක් ඇති කරනුයේ,

(1) CFC (2) $NO_2$ (3) $SO_2$ (4) $CH_4$ (5) $CO_2$

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

## කෘෂි විද්‍යාව - II

**12 ශ්‍රේණිය** | **කාලය පැය 03 යි.**

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. (එක් ප්‍රශ්නයකට ලකුණු 10 කි.)**
- **මෙම ප්‍රශ්න පත්‍රය A හා B යන කොටස් දෙකකින් යුක්ත වේ.**

**<u>A කොටස  ව්‍යුහගත රචනා</u>**

01 (a) බද්ධයක් සිදුකළ පසු පටක භාවීම සඳහා කැම්බියම් පටකය වැදගත් වේ.

(i) සාර්ථක බද්ධ කිරීමක් සඳහා අවශ්‍ය වන මූලික අවශ්‍යතා තුනක් සඳහන් කරන්න.

1. ..............................
2. ..............................
3. ..............................

(ii) ජාන සංරක්ෂණය කරන ප්‍රධාන ආකාර දෙකක් නම් කරන්න.

1. ..............................
2. ..............................

(b) (i) ප්‍රවේණික විචලතාවය ඇතිකළ හැකි ක්‍රම දෙකක් සඳහන් කරන්න.

1. ..............................
2. ..............................

(ii) බීජ ප්‍රරෝහණයට බලපාන සාධක තුනක් නම් කරන්න.

1. ..............................
2. ..............................
3. ..............................

(c) (i) අත්‍යාවශ්‍ය මූලද්‍රව්‍යවල ලක්ෂණ තුනක් සඳහන් කරන්න.

1. ..............................
2. ..............................
3. ..............................

(ii) රසායනික පොහොර භාවිතයෙහි වාසි 4 ක් සඳහන් කරන්න.

1. ..............................
2. ..............................
3. ..............................
4. ..............................

(iii) කාබනික පොහොර භාවිතයෙහි අවාසි 3 ක් සඳහන් කරන්න.

1. ..........................................................................................................

2. ..........................................................................................................

3. ..........................................................................................................

02 (a) (i) ශාක වර්ධනයට පාංශු $P^H$ අගය බලපාන ආකර 2 ක් ලැයිස්තු ගත කරන්න.

1. ..........................................................................................................

2. ..........................................................................................................

(ii) ජිප්සම් ($CaSO_4$) පසට එක්කිරීමෙන් පසෙහි $P^H$ අගය වැඩි නොවුන මුත් කැල්සියම් ඔක්සයිඩ් ($CaO$) පසට එක් කිරීමෙන් පසේ $P^H$ අගය වැඩිවීමට හේතුව කුමක් ද?

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

(b) (i) ශාක මුල්වල මනා වර්ධනය සඳහා පස තුළ සමහර පාරිසරික තත්ත්ව පැවතීම අවශ්‍ය වේ. එවැනි පාංශු පරිසර තත්ත්ව තුනක් ලැයිස්තුගත කරන්න.

1. ..........................................................................................................

2. ..........................................................................................................

3. ..........................................................................................................

(ii) බිම වැතිරී වැඩෙන බහු වාර්ෂික වල් පැළෑටි මර්දනය අපහසුවීමට හේතු දෙකක් දක්වන්න.

1. ..........................................................................................................

2. ..........................................................................................................

(c) (i) අත්‍යවශ්‍ය මූලද්‍රව්‍යයක් යනු කුමක් ද?

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

(ii) මහා පෝෂකයක් හා ක්ෂුද්‍ර පෝෂකයක් අතර ප්‍රධාන වෙනස කුමක් ද?

..........................................................................................................

..........................................................................................................

03 (a) (i) පසක කැටායන හුවමාරු ධාරිතාවේ වාසි දෙකක් සඳහන් කරන්න.

1. ..........................................................................................................

2. ..........................................................................................................

(ii) ගොවිතැන් සඳහා බිම් සකස් කිරීම මගින් පරිසර පද්ධතියට කරනු ලබන බලපෑම් තුනක් සඳහන් කරන්න.

1. ..........................................................................................................

2. ..........................................................................................................

3. ..........................................................................................................

The National e-learning Portal / The General Education

03

(b) හරිතාගාර තුළ ශාක වගා කිරීමේ වාසි 2 ක් ලැයිස්තුගත කරන්න.

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

(c) (i) වාණිජ හරිතාගාර ඉදිකිරීම සඳහා භාවිතා වන ව්‍යුහමය ද්‍රව්‍ය දෙකක් ලැයිස්තුගත කරන්න.

1. .............................................................................................................

2. .............................................................................................................

(ii) පොලිතීන් උමං තුළ බෝග වගා කිරීමේ දී මුහුණ දීමට සිදුවන සීමාකාරී තත්ත්වයක් ලැයිස්තුගත කරන්න.


.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

04 (a) පහත අංක (i) හා (ii) ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට දී ඇති රූප සටහන භාවිතා කරන්න.



(i) ඉහත රූප සටහනේ දැක්වෙන රූපය නම් කරන්න.

.............................................................................................................

(ii) පාංශු හා ජල සංරක්ෂණය සඳහා ඉහත රූප සටහනේ දැක්වෙන කුඤ්ඤ පේළිය දිගේ සකස් කිරීමට සුදුසු ව්‍යුහ තුනක් නම් කරන්න.

1. .............................................................................................................

2. .............................................................................................................

3. .............................................................................................................

(b) කාන්ති උඩරට ප්‍රදේශයේ කැපූ මල් වගාවක් ආරම්භ කිරීමට සැලසුම් කර තිබේ.

(i) ඇයගේ වගාවට සුදුසු ශාක ප්‍රචාරන ව්‍යුහයක් නම් කරන්න.

.............................................................................................................

(ii) පහතරට තත්ත්ව යටතේ ඉහත ව්‍යුහය භාවිත කිරීමේ දී ඇයට මුහුණදීමට සිදුවන ප්‍රධාන අවාසිය කුමක් ද?

.............................................................................................................

.............................................................................................................

(iii) පහතරට තත්ත්වවලට ගැළපෙන පරිදි ඔබ මෙම ව්‍යුහය නවීකරණය කරන්නේ කෙසේද?

..........................................................................................................

..........................................................................................................

(c) (i) එක්තරා බෑවුම් සහිත ඉඩමක වාර්ෂික වල්පැළ වැවී ඇත. මෙම භූමියේ වල්පැළ පාලනය සඳහා සුදුසු ක්‍රමයක් නම් කරන්න.

..........................................................................................................

(ii) ක්‍රියාකාරීත්වය අනුව වල්නාශක වර්ගීකරණය කරන්න.

..........................................................................................................

..........................................................................................................

## B කොටස රචනා

- **ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න. අවශ්‍ය තැන්හිදී නම් කරන ලද පැහැදිලි රූප සටහන් දෙන්න. (එක් ප්‍රශ්නයකට ලකුණු 15 බැගිනි.)**

01 (a) ශ්‍රී ලංකාවේ ඊසාන දිග හා නිරිත දිග මෝසම් ඇතිවීමට බලපාන සාධක පිළිබඳව සටහන් ලියන්න.

(b) ඔබගේ පාසල් විද්‍යාගාරයේ දී බීජවල ප්‍රරෝහණ ප්‍රතිශතය මනින්නේ කෙසේදැයි විස්තර කරන්න.

(c) බහු වාර්ෂික වල් පැළෑටි හඳුන්වා ඒවා සාර්ථකව පාලනය කළහැකි ක්‍රම විස්තර කරන්න.

02 (a) ශ්‍රී ලංකාවේ පලතුරුවල හා එළවළුවල පසු අස්වනු හානි අවම කර ගැනීම සඳහා උචිත ක්‍රම විස්තර කරන්න.

(b) ප්‍රභාසංස්ලේෂණයට බලපාන බාහිර සාධක විස්තර කරන්න.

(c) නියම ආකාරයට පොහොර භාවිත නොකිරීමෙන් හටගන්නා ගැටළු පැහැදිලි කරන්න.

03 (a) වගාව සඳහා සකස් කළ පසක ලක්ෂණ කවරේද?

(b) ඉහළ ගුණාත්මයෙන් බීජ හා රෝපණ ද්‍රව්‍යවල වැදගත්කම විස්තර කරන්න.

(c) ශාක අතු බැඳීමේ විවිධ ක්‍රම විස්තර කරන්න.

04 (a) පාංශු ව්‍යුහය යනු කුමක් ද? පාංශු ව්‍යුහ පවතින ආකාරයන් හතර රූප සටහන් සහිතව ඇඳ විස්තර කරන්න.

(b) අධෝභෞම බීජ ප්‍රරෝහණය හා අපිභෞම බීජ ප්‍රරෝහණය අතර ඇති වෙනස්කම් විස්තර කරන්න.

(c) එළවළු නිෂ්පාදනයේ දී පසු අස්වනු හානි අවම කර ගත හැක්කේ කෙසේදැයි පැහැදිලි කරන්න.

05 (a) බීජ සුප්තතාවය යනු කුමක් ද? බීජ සුප්තතාවයට බලපාන සාධක මොනවා ද?

(b) ජල සැපයුම් කාලාන්තරය තීරණය කිරීමේ දී සැලකිය යුතු සාධක විස්තර කරන්න.

(c) බිම් සැකසීමේ විවිධ පියවර විස්තර කරන්න.

06 (a) බෝගවලට වල්පැළෑටි මගින් සිදුවන හානිදායක බලපෑම් පැහැදිලි කරන්න.

(b) ශාකයකට අත්‍යවශ්‍ය මූලද්‍රව්‍ය ලැයිස්තුගත කරන්න. එම මූලද්‍රව්‍ය ශාකයකට අත්‍යවශ්‍ය මන්දැයි පැහැදිලි කරන්න.

(c) මිශ්‍ර බෝග වගාවේ වාසි සහ අවාසි සඳහන් කරන්න.